# ඉන්දියානු ග්‍රාමීය කාන්තාවන්ගේ සමාජ භූමිකාවේ වර්ධනය 'The Elephant Whishperers' වාර්තා චිත්‍රපටය ඇසුරින්

*ඩබ්.කේ.ඩී. සෞම්‍යා සරත්චන්ද්‍ර*[1]

වාර්තා චිත්‍රපට (Documentary Film) සමාජ විශ්ලේෂණය සඳහා භාවිත කළ හැකි ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් වන අතර, ලෝක සිනමාවේ ප්‍රවර්ධනයට මෙන්ම සමාජ ප්‍රවාහයට ද දැඩි බලපෑමක් එල්ල කරන්නා වූ නිර්මාණාත්මක ප්‍රවේශයකි. මාධ්‍යයන් හරහා ලොවට අභිමුඛ වන සිනමාව, අද වන විට ගවේෂණාත්මක ක්‍රමවේදයන් හරහා වාර්තා සිනමාපට නිර්මාණයට සුවිශේෂී ස්ථානයක් ලබා දී ඇත. ඒ අතරින් ඉන්දියානු වාර්තා චිත්‍රපට නිර්මාණ ශිල්පිනියක් වන Kartiki Gonsalves ගේ `*The Elephant Whishperers*` (2022) නම් වු ගවේෂණාත්මක වාර්තා චිත්‍රපටය (Exploration Documentary) ඉන්දායාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ වෙසෙන අනාථ වූ අලි පැටවුන් රැකබලාගන්නා යුවලක් වටා ගෙතෙන්නකි. වාර්තා චිත්‍රපට පිළිබඳ නිර්මාණය වී ඇති පර්යේෂණ අධ්‍යයනය සාහිත්‍ය විමර්ශනය තුළ සිදු කළ අතර, එහි දී මෙම වාර්තා චිත්‍රපටයෙහි කාන්තා නිරූපණය පිළිබඳ පර්යේෂණය කේන්ද්‍ර කරගැනීම පර්යේෂණ හිඩැස ලෙස හඳුනාගන්නා ලදී. සමාජ සංවෘත වූ ඉන්දියානු ග්‍රාමීය කාන්තාවන්ගේ සමාජ භූමිකාවේ වර්ධනය අධ්‍යයනය කිරීම, ඒ සඳහා ඉන්දියානු මාධ්‍යය සමාජයේ බලපෑම, වාර්තා චිත්‍රපට මානව විද්‍යාත්මක මූලාශ්‍රයන් ලෙස අධ්‍යයනය කිරීම සඳහා ශාස්ත්‍රීය පර්යේෂණයේ භාවිතය මෙන් ම, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස වාර්තා චිත්‍රපටකරණය පිළිබඳ අධ්‍යයනයක නිරත වීම, මෙම ශාස්ත්‍රීය කතිකාවතේ මුඛ්‍ය අරමුණු වේ. සමාජයෙන් මුළුගැන්වී තවදුරටත් සිටිනු විනා, සොබාදහම සමඟ ද මුහු වෙමින් තම ආයාසයන් නොයෙක් ආකාරයෙන් විදහා දක්වන ඉන්දියානු ග්‍රාමීය කාන්තාවන්ගේ සමාජ භූමිකාවේ වර්ධනය සිදු වී ඇති ආකාරය කෙසේ ද යන්න පර්යේෂණයට ලක් කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ. ගුණාත්මක දත්ත මත පදනම් වූ අන්තර්ගත විශ්ලේෂණයක් ලෙසින් මෙම පර්යේෂණය සිදු කරන අතර වාර්තා චිත්‍රපටය පඨිතයක් ලෙස ගෙන ඒ මත පදනම් වූ පර්යේෂණ, විචාර වැනි ලිඛිත, ශ්‍රව්‍ය දෘශ්‍ය මුලාශ්‍රය අධ්‍යයනය හරහා දත්ත රැස් කිරීමක් ලෙස සිදු කරන ලදී. මෙම වාර්තා චිත්‍රපටිය තුළ අන්තර්ගත රූප රාමු, පසුබිම් කථන හා ශබ්ද සහ සම්මුඛ සාකච්ඡා පාදක කරගනිමින් අන්තර්ගත විශ්ලේෂණය සිදු කරන ලදී. ඒ අනුව ග්‍රාමීය කාන්තාවන් තවදුරටත් මෙවැනි සුළුපටු නොවන, මෙතෙක් ඔවුන් ළඟා නොවූ තම සමාජ ජීවිකාවේ නව පරිචයන් වෙත යොමුවීම ගැන විවිධ දෘෂ්ටිවාදයන් ගොඩනැගුණ ද, ඔවුන් ක්‍රමයෙන් යාවත්කාලීන වන ලෝකයට නව මුහුණුවරකින් නිරාවරණය වීම ධනාත්මක අයුරින් සිදු වන අයුරු මෙන් ම, ඔවුන් වටා නිර්මාණය වී ඇති සමාජ, ආර්ථික, පාරිසරික, සන්නිවේදන පසුබිම මෙම පර්යේෂණය ඇසුරින් තහවුරු කරගැනීමට හැකි විය.

***ප්‍රමුඛ පද :*** වාර්තා චිත්‍රපටය, ඉන්දියානු ග්‍රාමීය සමාජය, කාන්තාව, ඉන්දියානු මාධ්‍ය සමාජය, සන්නිවේදනය

[1] කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය. contactsaumyasarathchandra@gmail.com